2019 06.05 අද

බලශක්තිය සංරක්ෂණය කර ගිගාවොට් පැය 300ක් ඉතිරි කර ගැනීමට සැලසුමක්

■ **චාමර සම්පත්**

බලශක්ති සංරක්ෂණ ජාතික වැඩසටහනක් හඳුන්වා දී එමගින් වාර්ෂිකව ගිගාවොට් පැය 300ක බලශක්තියක් ඉතිරි කර ගැනීමට විදුලිබල බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය සැලසුම් කර තිබේ.

මෙම විදුලි ප්‍රමාණය ශ්‍රී ලංකාවේ දින දහයක සමස්ත විදුලිබල ඉල්ලුමට සමාන වන අතර, සියලු රජයේ කාර්යාලවල පෙර වර්ෂයට සාපේක්ෂව 10%කින් විදුලිය සහ ඉන්ධන පරිභෝජනය අඩුකර ගැනීම ඉලක්ක කර ඇතැයි එම අමාත්‍යාංශය සඳහන් කළේය.

ඉදිරියේදී ඇතිවිය හැකි බලශක්ති අර්බුදයට තිරසර පිළියම් සෙවීමට මේ වනවිට රජයේ අවධානය යොමුවී ඇති අතර, ඒ අනුව රාජ්‍ය ආයතනවල බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂම භාවිතය වෙනුවෙන් නව චක්‍රලේඛයක් නිකුත් කර, බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂම භාවිතය පිළිබඳ ජාතික වැඩසටහන හඳුන්වා දීම සඳහා මෙම පියවර ගත් බවද අමාත්‍යාංශය පැවසීය.

විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය, ජනාධිපති කාර්යාලය හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය එක්ව දියත් කරනු ලබන මෙම ක්‍රියාවලිය සඳහා සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සහභාගි කර ගැනීමට අදහස් කර තිබේ. ඒ අනුව ඉහත සඳහන් සෑම ආයතනයක් තුළම බලශක්ති කළමනාකරුවෙකු පත්කර, ඔහුගේ සහාය වෙනුවෙන් බලශක්ති සංරක්ෂණ කමිටු පිහිටුවීමට සැලසුම් කර ඇති බවද අමාත්‍යාංශය සඳහන් කළේය.

විදුලි උත්පාදනය වෙනුවෙන් ඉන්ධන ලබා ගැනීමට ජාතික අපනයන ආදායමෙන් 25%ක් වැනි මුදලක් වාර්ෂිකව වැය කිරීමට ශ්‍රී ලංකා රජයට සිදුව ඇති අතර, එමෙන්ම ජනතාවගේ අකාර්යක්ෂම භාවිතය නිසා 25% අපතේ යන බවද ගණනය කර තිබේ.

ඒ අනුව බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂම භාවිතය පිළිබඳ ජාතික වැඩසටහන හඳුන්වා දීමෙන්, විදුලි පාරිභෝගික ජනතාව අපතේ යෑමෙන් තොර කාර්යක්ෂම විදුලිබල පරිභෝජන රටාවකට හුරුවීමෙන් සහ බලශක්ති සංරක්ෂණයට යොමුවීමෙන් අනාගතයේදී මුහුණදිය හැකි බලශක්ති අර්බුදයෙන් රට මුදාගැනීමට හැකි වෙතැයි අමාත්‍යාංශය අපේක්ෂා කරයි.

රිය අනතුරු අද

අනතුරු වළකමු ජීවිත රැකගමු

වෑන් - කැබ් අනතුරින් 05කට තුවාල

■ **ගම්පහ තිලකරත්න දිසානායක**

උඩුගම්පොළ, වීදියවත්ත මංසන්ධියේදී ඊයේ (04දා) අලුයම වෑන් රථයක් හා කැබ් රථයක් එකිනෙක ගැටීමෙන් පස්දෙනෙකු තුවාල ලබා ඇතැයි ගම්පහ පොලීසියේ රථවාහන අංශය පවසයි.

මහව ප්‍රදේශයේ සිට කරාපිටිය රෝහලට හෘද රෝගියෙකු රැගෙන යමින් තිබූ වෑන් රථයක් මෙලෙස අනතුරට පත්ව ඇත.

මෙම අනතුරින් වෑන් රථයෙහි ගමන් ගනිමින් සිටි බී.එම්.බණ්ඩාරනායක (67) නමැති රෝගියාගේ 29 හැවිරිදි දියණිය සහ ඇගේ දෙහැවිරිදි දරුවාද, රෝගියාගේ 27 හැවිරිදි පුතා සහ වෑන් රථය පැදවූ 23 හැවිරිදි රියදුරා හා කැබ් රථයේ රියදුරාද මෙසේ තුවාල ලබා සිටිති.

අනතුරින් තුවාල ලැබූවෝ ගම්පහ රෝහලට ඇතුළත් කොට සිටිති.

ගම්පහ මූලස්ථාන පොලීසියේ රථවාහන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක වසන්ත පුෂ්පකුමාර මහතාගේ උපදෙස් මත කොස්තාපල් ගුණසේකර මහතා අනතුර පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

ඔබට නිදිමත දැනේනම් රිය පැදවීමෙන් වළකින්න

පාස්කු ප්‍රහාරය සොයා බැලීමේ කමිටුවට හිටපු නි.පොලිස්පති නාලක ද සිල්වා සාක්ෂි දෙයි

■ **අමිත් මධුරංග**

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳ සොයා බැලීමේ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවට, ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ හිටපු අධ්‍යක්ෂ නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා ඊයේ (04දා) කැඳවා තිබිණි.

කාරක සභාව ඊයේ සවස 3.30ට පමණ ආරම්භ වූ අතර, එම අවස්ථාව ආවරණය කිරීමට මාධ්‍යවේදීන්ට පැය දෙකක පමණ කාලයක් ලබාදීමට එහි සාමාජිකයෝ කටයුතු කළහ.

ජාතික ආරක්ෂාවට සංවේදී කරුණු පිළිබඳ සාක්ෂි විමසීම ඉන් අනතුරුව සිදුවිය.

සාක්ෂි විමසීම සඳහා රවි කරුණානායක, රාජිත සේනාරත්න, සරත් ෆොන්සේකා, රවුෆ් හකීම්, ජයම්පති වික්‍රමරත්න, ආශු මාරසිංහ, නලින්ද ජයතිස්ස, එම්.ඒ. සුමන්තිරන් යන මහත්වරු එක්ව සිටියහ.

මීළඟ විශේෂ කාරක සභාව එළැඹෙන 06 වැනිදා උදෑසන 11.00ට රැස්වීමට නියමිතය.

මඩකලපුව පෞද්ගලික විශ්ව විද්‍යාලය අහෝසි කරන්න

අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය කොළඹදී විරෝධතාවක්

■ **එච්.අයි. තුෂාර/ ජායාරූප එශාන් ප්‍රනාන්දු**

අධ්‍යාපනය විකුණා දමන මඩකලපුව පෞද්ගලික විශ්වවිද්‍යාලය ඇතුළුව අධ්‍යාපනය විකුණා දමන ආයතන අහෝසි කරන ලෙස ඉල්ලා අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය ඊයේ (04දා) කොළඹදී විරෝධතාවක නිරත විය.

මරදානේ සිට පාගමනින් කොටුව දුම්රිය පොළ ඉදිරිපිටට පැමිණි ශිෂ්‍යයන් මෙම විරෝධතාව පැවැත්වූ අතර, මෙම ඉල්ලීම්වලට අමතරව ආගම, ජාතිය පදනම්වීම් අධ්‍යාපන ආයතන ස්ථාපිත කිරීම නවතා දැමීමටද ආණ්ඩුව කටයුතු කළයුතු

බවද අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු මහිල් බණ්ඩාර මහතා සඳහන් කළේය.

මඩකලපුව ප්‍රදේශයේ ඉදිකරමින් තිබෙන පෞද්ගලික විශ්වවිද්‍යාලය වහාම අවලංගු කර දැමිය යුතු බවද ඒ මහතා පවසා සිටියේය.

ඉදිරි දින කිහිපය තුළ රජය මේ පිළිබඳ තීරණයක් ගැනීමට කටයුතු නොකළහොත් දැඩි ක්‍රියාමාර්ග ගන්නා බවද හෙතෙම පවසා සිටියේය.

එක් එක් ජන කොට්ඨාස මත ක්‍රියාත්මක වන නීති අහෝසි කළ යුතුයි

ජවිපෙ නායක අනුර කුමාර දිසානායක

■ **එච්.අයි. තුෂාර**

එක් එක් ජන කොට්ඨාස මත ක්‍රියාත්මක වන නීති අහෝසි කර ශ්‍රී ලාංකික ජාතියක් ලෙස ගොඩනැගීම සඳහා පොදු නීතියක් සකස් කළ යුතු බව ජනතා විමුක්ති පෙරමුණ සඳහන් කරයි.

ජාතික සමගිය ගොඩනැගීමෙන් තොරව මහජන ආරක්ෂාවක් නොමැති බවත්, අපේ රටේ මහජන ආරක්ෂාව කිසිදු ජාතිවාදියෙකුට ලබාදිය නොහැකි බවත් එම පක්ෂයේ නායක අනුර කුමාර දිසානායක මහතා පැවසීය.

ජාතිවාදී නායකයෙකුට කළ හැකි වන්නේ මහජනයාගේ ආරක්ෂාව පිළිබඳ තැතිගැන්මක්

දෙගිඩියාවක් නිර්මාණය කිරීමට පමණක් බවද ඒ මහතා පවසා සිටියේය.

ජාතික සමගිය තහවුරු කිරීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කර තිබෙන විශේෂ යෝජනා මාලාව ජනගත කිරීමේ අවස්ථාවට ඊයේ (04දා) සහභාගි වෙමින් අනුර කුමාර දිසානායක මහතා මේ බව පවසා සිටියේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ පක්ෂ නායකවරයා පවසා සිටියේ, කිසිදු අන්තවාදයකට ජන කොට්ඨාසයක් මුළුමනින්ම විනාශ කළ නොහැකි බවත්, මේ නිසා හෙටත් සිංහල, දෙමළ, මුස්ලිම් ජන කොට්ඨාස මේ රට තුළ ජීවත්වන බවත්ය.

මේ අනුව මේ රටේ පැවැත්ම තිබෙන්නේ ජාතික සමගිය මත බවත්, මේ රටේ මේ අවස්ථාවේදී තිබෙන විනාශකාරී දුෂ්ටතම දේශපාලනය ජාතිවාදී දේශපාලනය බවත් ඒ මහතා පැවසීය.

පාස්කු ප්‍රහාරය වළක්වා නොගැනීම පිළිබඳ මූලික අයිතිවාසිකම් පෙත්සම් හෙට සලකා බැලෙයි

ඛෝබා බදාදා

කොච්චිකඩේ දේවස්ථානය ඇතුළු කතෝලික දේවස්ථානවලට මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර මාලාවක් එල්ල වන බවට බුද්ධි අංශ මගින් දැනුම්වත් කර තිබියදීත් එම ප්‍රහාර වැළැක්වීම සඳහා නිසි ක්‍රියාමාර්ග නොගැනීමෙන් ජනතාවගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇතැයි සඳහන් කරමින් කතෝලික පියතුමන්ලා තිදෙනෙකු, ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනුකොට ඇති සියලු මූලික අයිතිවාසිකම් පෙත්සම් හෙට (06දා) සලකා බැලීමට ශ්‍රේෂ්ඨාධිකරණය ඊයේ (21දා) තීරණය කළේය.

මෙම අපරාධ සම්බන්ධයෙන් බුද්ධි අංශ දැනුවත් කර තිබියදීත් ඊට නිසි පියවර නොගැනීමෙන් සිදුවූ මෙම අපරාධ සම්බන්ධයෙන් නිසි පරීක්ෂණ පවත්වන ලෙසද මෙම සිද්ධීන් හේතුවෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ ජනතාවට වන්දි ප්‍රදානය කරන ලෙසද පෙත්සම්කරුවන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටින අතර, මෙම පෙත්සම් පූර්ණ විනිසුරු මඬුල්ලක් හමුවේ සලකා බලන ලෙස ශ්‍රී ලංකා නීතිඥ සංගමය සහ නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලීම් කොට ඇත.

මෙම සියලු පෙත්සම් ප්‍රසන්න ජයවර්ධන, එල්.ටී.බී දෙහිදෙණිය, ප්‍රීතී පද්මන් සූරසේන යන මහත්වරුන්ගෙන් සමන්විත ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ලක් හමුවේ සලකා බැලිණි.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඇතුළු පාර්ශ්ව 05ක් මේ වනවිට ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කොට ඇත.

කතෝලික පියතුමන්ලා වන හෙන්රි මේරියන් අශෝක් ස්ටීවන්, සරත් ඉද්දමල්ගොඩ සහ හේල් එවන්ස්ටන් ප්‍රනාන්දු ජයවර්ධන සහ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ කළමනාකාර කමිටුව විසින් මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කර ඇති අතර එහි වගඋත්තරකරුවන් වශයෙන් හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු, ආරක්ෂක ලේකම් ශාන්ත කෝට්ටිගොඩ, පොලිස්පති පූජිත් ජයසුන්දර, වැඩබලන පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න, ත්‍රිවිධ හමුදාපතිවරුන්, අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු පිරිසක් නම් කොට ඇත.

කතෝලික පියතුමන්ලා වෙනුවෙන් නීතිඥ සුනිල් වටගල මහතාද, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ කළමනාකාර කමිටුව වෙනුවෙන් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්තිස්ස මහතාද ගොනුකොට ඇති මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම්වල පාස්කු ඉරිදා වන පසුගිය අප්‍රේල් 21 වැනිදා කතෝලික දේවස්ථානවල දිව්‍ය පූජාව පැවැත්වෙන අතර කතෝලික දේවස්ථාන ත්‍රිත්වයකට මෙන්ම රටේ ප්‍රධාන පෙළේ හෝටල් කිහිපයකට ත්‍රස්ත ප්‍රහාර එල්ල වූ බව සඳහන් කොට ඇත.

එම ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් දිවයිනේ ප්‍රකට කතෝලික දේවස්ථාන තුනක් සහ හෝටල් කිහිපයක් විනාශ වූ බවත්, ඒ අවස්ථාවේදී එම දේවස්ථානවල දිව්‍ය පූජාවන්ට සහභාගි වෙමින් සිටි සහ හෝටල්වල සිටි සාමකාමී මහජනතාව අතුරින් තුන්සියයකට පමණ මිනිස් ජීවිත ප්‍රමාණයක් අහිමි වී තවත් හයසියයකට අධික පිරිසක් තුවාල ලැබූ බවත් සඳහන් කරන පෙත්සම්කරුවෝ මෙම ප්‍රහාර පිළිබඳ බුද්ධි අංශ මගින් පූර්ව දැනුම්දීමක් කර තිබූ බවද සඳහන් කොට ඇත.

මෙම ප්‍රහාර පිළිබඳ බුද්ධි අංශ මගින් පූර්ව දැනුම්දීමක් කර තිබියදීත් ඒ පිළිබඳ රජය නිසි පියවර ගෙන නොමැති බවත්, මේ හේතුවෙන් පෙත්සම්කරුවන්ගේත්, ජනතාවගේත් මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවත් පවසන පෙත්සම්කරුවෝ මේ සම්බන්ධයෙන් සුදුසු පරීක්ෂණයක් පැවැත්වීමට නියම කරන්නැයි ඉල්ලා සිටිති. මෙම තත්ත්වය හේතුවෙන් තමන්ගේත්, ජනතාවගේත් මූලික අයිතිවාසිකම් කඩ වී ඇතැයි ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින පෙත්සම්කරුවෝ සිද්ධියෙන් හානි වූ පුද්ගලයන්ට වන්දි ගෙවීමට නියම කරන්නැයි ඉල්ලා සිටිති. වගඋත්තරකරුවන්ගේ නොසැලකිලිමත් ක්‍රියාකලාපය හේතුවෙන් සිදු වූ මනුෂ්‍ය ඝාතන හා තුවාල කිරීමේ සිද්ධීන් සම්බන්ධයෙන් වගකිවයුතු පොලිස්පතිවරයාට එරෙහිව අපරාධ නීතිය යටතේ නඩු පවරන ලෙස නීතිපති වෙත නියෝගයක් නිකුත් කරන්නැයිද පෙත්සම්කරුවෝ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටිති.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය වෙනුවෙන් ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා පෙනී සිටි අතර, නීතිපති වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ ෆර්සානා ජමීල් මහත්මිය පෙනී සිටියාය.

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ සේවකයෝ පිරිසක් විපක්ෂනායක හමුවෙති

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ සේවකයෝ පිරිසක් පෙරේදා (03දා) සවස විජේරාම පෙදෙස පිහිටි නිල නිවසේදී විපක්ෂනායක මහින්ද රාජපක්ෂ මහතා හමුවූහ.

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව යටතේ උපපාලිත සමාගමක් බවට පත්කිරීමට කටයුතු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ සේවකයන්ට හිමි රාජ්‍ය බැංකුවක සේවක වරප්‍රසාද අහිමි වී, දැනට එහි සේවය කරන 110ක සේවක පිරිස විශාල අසාධාරණයකට ලක්වන බව ඔවුහු එහිදී විපක්ෂනායකතුමා වෙත පෙන්වා දුන්හ.

ප්‍රමුඛ ඉතිරි කිරීමේ සංවර්ධන බැංකුව 2002.05.25 වැනිදා වසාදමා එහි සියලු වත්කම් හා වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ගනු ලැබීමෙන් එකී බැංකුවේ තැම්පත්කරුවන්ට සිදු වූ අසාධාරණයට විසඳුමක් ලෙස 2008.03.10 වැනිදා මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති හා මුදල් අමාත්‍යවරයා ලෙස කටයුතු කළ වකවානුවේ ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව පිහිටු වූ බවත්, එම තැම්පත්කරුවන්ගෙන් 80%කට තම තැන්පතු මේ වනවිට ගෙවීමට කටයුතු කර ඇති බවත් ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ සේවකයෝ පෙන්වා දුන්හ.

ඉතිරි 20%ක තැන්පතු මුදල් ගෙවීම සඳහාද බැංකුව සතුව මුදල් ඇතැයිද ඔවුහු විපක්ෂනායකවරයා සමග පවසා සිටියහ.

මේ පිළිබඳ මහ බැංකුව සමග සාකච්ඡා කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස එම අවස්ථාවට එක්වූ ඒකාබද්ධ විපක්ෂ මන්ත්‍රීවරුන්ට උපදෙස් දුන් විපක්ෂනායක මහින්ද රාජපක්ෂ මහතා, පාර්ලිමේන්තුවේ අවධානයද මේ සඳහා යොමු කරවීමට කටයුතු කරන බව වැඩිදුරටත් පැවසීය.

මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගාමිණී ලොකුගේ හා ජොන්ස්ටන් ප්‍රනාන්දු යන මහත්වරුද එක්ව සිටියහ.

බද්දේගම තේ වතුවල කටුපොල් වගාව අරඹලා

■ **ඉන්දික හේවාවිතාරණ**

මෙරට තුළ කටුපොල් වගාකිරීම තහනම් කර තිබියදී, බද්දේගම ප්‍රදේශයේ පවතින රජයේ තේ වතුවල මේ වනවිට කටුපොල් වගාකිරීම ආරම්භ කර ඇතැයි වතු සේවකයෝ හා ප්‍රදේශවාසීහු සඳහන් කරති.

රජයට අයත් මෙම වතු, සමාගම් විසින් පාලනය කරනු ලබන බවත්, බද්දේගම ප්‍රදේශයේ පවතින තේ වගාව, ආදර්ශ තේ වගාවක් ලෙස පවත්වාගෙන ගිය බවත් එම පිරිස් පෙන්වා දෙති. කටුපොල් වගාව හරහා පරිසර දූෂණය හා භූගත ජල විනාශයන් සිදුවන බැවින් ජාතික ආර්ථික සභාව විසින් මෙම වගාව ආරම්භ කිරීම තහනම් කර තිබෙන බවත්, මීට අමතරව බීජ ගෙන්වීමද නවතා දමා තිබෙන බවත් ප්‍රදේශවාසීහු පවසා සිටිති.

එසේ තිබියදී, දකුණු පළාතේ දේශපාලනඥයන්ගේ සහයෝගයෙන් අදාළ කටයුත්ත සිදුකරන බවත්, මෙම වගාව සිදුකළ හොත් අවට ප්‍රදේශවල සියලු ජල උල්පත් සිඳීයන බවත් පරිසරවේදීහු සඳහන් කරති.

කටුපොල් වගාකිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා වල්පිට තේ වත්තේ තිබූ තේ කර්මාන්ත ශාලාව පවා වසාදමා තිබෙන බවද ප්‍රදේශවාසීහු පෙන්වා දෙති.

වෛද්‍ය පාදෙණියට එරෙහි පෙත්සම් විභාගයෙන් විනිසුරු ජනක් ඉවත්වෙයි

■ **බුද්ධිමාල් රුබේරු**

රැස්වීමකදී සිදුකළ අදහස් දැක්වීමකින් අධිකරණයට අපහාසයක් සිදුකළ බවට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති, විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මහතාට එරෙහිව ගොනු කර ඇති පෙත්සම් විභාගයෙන් අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මහතා ඊයේ (04දා) ඉවත් විය.

වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මහතාට එරෙහි මෙම පෙත්සම විභාග කිරීම සඳහා අභියාචනාධිකරණ විනිසුරුවරුන් වන ජනක් ද සිල්වා සහ බන්දුල නිශ්ශංක කරුණාරත්න යන මහත්වරුන්ගෙන් සමන්විත අභියාචනාධිකරණ විනිසුරු මඬුල්ල ඉදිරියේ කැඳවනු ලැබූ අවස්ථාවේදී මෙම පෙත්සම් විභාගයෙන් තමන් ඉවත් වන බවට අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මහතා දැනුම් දුන්නේය.

ඒ අනුව මෙම පෙත්සම් විභාගය කල් තැබූ අතර, පෙත්සම් විභාගය සඳහා නව විනිසුරු මඬුල්ලක් පත්කිරීමට පෙත්සම ලබන 14 වැනිදා අභියාචනාධිකරණ සභාපති විනිසුරු යසන්ත කෝදාගොඩ මහතා ඉදිරියේ කැඳවීමට නියම කළේය.

සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික ව්‍යාපාරයේ කැඳවුම්කරු මහාචාර්ය සරත් විජේසූරිය සහ ගාමිණී වියන්ගොඩ යන මහත්වරුන් විසින් අභියාචනාධිකරණයට ඉදිරිපත් කොට ඇති මෙම පෙත්සමේ වගඋත්තරකරු වශයෙන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති, විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මහතා නම් කොට ඇත.

වගඋත්තරකාර විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙණිය මහතා 2017 අප්‍රේල් මස 07 වැනිදා කොළඹ කොටුවේ පැවැති රැස්වීමක් අමතමින් අධිකරණයට අපහාස වන ආකාරයේ කරුණු පවසා ඇතැයි පෙත්සම්කරුවෝ සඳහන් කරති.

එහෙයින් මෙම පෙත්සම විභාග කර අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරුට දඬුවම් පමුණුවන්නැයි පෙත්සම්කාර පාර්ශ්වය අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

ඉදිරිපත් වූ කරුණු සැලකිල්ලට ගත් අභියාචනාධිකරණය මෙම පෙත්සම ලබන 14 වැනිදා කැඳවීමට නියම කළේය.